දැරණියගල ප්‍රාදේශීය සභාව

කෑගල්ල දිස්ත්‍රික්කය

-------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූලි 14 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට දැරණියගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ ) 2015 වර්ෂයේ ගිණුම් විගණනයේදී නිරීක්ෂණය කරන ලද පහත සඳහන් අඩුපාඩු නිවැරදි කරන බවට 2015 විගණකාධිපති වාර්තාවට ඉදිරිපත් කරන ලද පිළිතුරු අනුව දන්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(i) 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ජල පාරිභෝගිකයන් විසින් ජල සැපයුම් ලබාගැනීම සඳහා තැන්පත් කර තිබුණු රු. 2,305,983 ක් ජල සැපයුම ලබාදීමේ කටයුතු සඳහා වැයකර තිබියදී පොදු තැන්පත් යටතේ දැක්වීම.

(ii) පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ලැබී තිබුණු පරිගණක 02 ක් සහ ඊට අදාල උපාංග හා බහුවිධ මොඩියුල යන්ත්‍රයක වටිනාකම ගණනය කර ගිණුම්ගත නොකිරීම.

(iii) සැපයුම් හා උපකරණ වියදම් , ගබඩා අත්තිකාරම් ගිණුම් මගින් ගැලපීම් නොකර වැය ශීර්ෂයට සෘජුව හර කරමින් ගිණුම්ගත කර තිබීම.

(iv) සභාව සතු අක්කර 01යි රූඩ් 03 යි පර්චස් 30 ක් වූ ඉඩම් කොටස් 03 ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගත නොකිරීම.

(ආ) බස්නැවතුම්පල ආශ්‍රිත වෙළඳපල කඩකාමර 29 ක් පෙරගෙවුම් ක්‍රමය යටතේ ඉදිකර බදුදීම පිණිස 2015 වර්ෂයේ දී බදුකරුවන් 29 දෙනෙකුගෙන් ලබාගෙන තිබුණු රු.24,299,000 ක එක්වන් මුදල් (key money) පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන අදාල කාර්යයට යොදවා කඩකාමර හිමිකරුවන්ට කඩකාමර භාරදීමේදී ආදායම් ලෙස ගිණුම්ගත කළයුතු වුවත් එසේ නොකර මුදල් ලබා ගන්නා අවස්ථාවේදීම ආදායම් ලෙස ගිණුම්ගත කර එම මුදල් අදාල කාර්යයන්ට නොව වෙනත් කටයුතු සඳහා වැයකර තිබුණි. මීට අමතරව ගිවිසුම්වලට එළඹ නොතිබුණු තවත් කඩ කාමර 24 ක් සඳහා අයවිය යුතු පෙර ගෙවුම් මුදල් රු.24,630,000 ක් ඉකුත් වර්ෂයේ ආදායම් ලෙස හා ණයගැතියන් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ණයගැතියන් හා සමුච්චිත අරමුදල් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(ඇ) යෝජිත බස් නැවතුම්පොලේ කඩ කාමර ඉදිකිරීම මෙතෙක් ආරම්භ කර නොතිබුණද ඉදිකිරීම් සැලැස්ම අනුව දළ වියදම් ඇස්තමේන්තුව වූ රු. 25,500,000 ක් 2015 වර්ෂයේ වියදම් ලෙස හා ණයහිමියන් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ණයහිමියන් රු. 25,500,000 කින් වැඩියෙන් හා සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ඈ) සතිපොල කඩ කාමරයක් සමාලෝචිත වර්ෂයේදී අතුරු බදුදීමේදී අතුරු බදුකරුගෙන් අයකරගෙන තිබුණු සියයට 25ක අමතර පෙර ගෙවුම් මුදල වූ රු.145,000 ක් වර්ෂයේ ආදායමට නොගෙන එක්වන් මුදලින් (key money) අඩු කිරීම හේතුවෙන් ලැබිය යුතු සතිපොල ආදායම් හා ලැබිය යුතු එක්වන් මුදල් ණයගැතියෝ රු.145,000 කින් අඩුවෙන් දැක්වුණි.

(ඉ) සභාවේ ආදායම් ලෙස ගිණුම්ගත කළයුතු ගොඩනැගිලි අයදුම්පත් දඩ රු.43,600 ක් පොදුතැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්

------------------------------

ගිණුම් විෂයයන් 06 කට අදාලව මුල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.15,468,868 ක් හා උපයෝගී ලේඛන/ වාර්තා අනුව ශේෂයරු.11,333,399 ක් වූයෙන් නොසැසඳුන වෙනස රු.4,135,469 ක් විය .

1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 76,449,306 ක් වූ අතර එයින් රු. 6,381,651 ක් වර්ෂයකට වඩා පැරණි ශේෂයන් විය.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 67,729,923 ක් වූ අතර එයින් රු. 1,213,700 ක් වර්ෂයකට වඩා පැරණි ශේෂයන් විය.

1.3.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

------------------------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) වගන්තිය | වර්ෂ 2 ට වැඩි හිඟ වරිපනම් බදු රු.141,716 ක් හා අක්කර බදු රු.566,707 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 (2) ආ | තත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්යය නිමකල විගසම පියවිය යුතු වුවත් 2016 වර්ෂයේ අවස්ථා 14 ක් තුළ ලබාගත් රු.129,700 ක අග්‍රිම පියවීමේදී දින 01 සිට දින 11 දක්වා වූ ප්‍රමාදයන් නිරීක්ෂණය විය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 1.6 හා 4 වගන්ති | සේවකයන් 10 දෙනෙකුගෙන් 1993 වර්ෂයේ සිට අයවිය යුතු රු. 243,610 ක ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2010 නොවැම්බර් 16 දිනැති සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් ගේ සීඑම්/ඒඩී /20/03 දරන චක්‍රලේඛය | කණිෂ්ඨ සේවකයන් ලෙස පත්වීම් ලබා ඇති සියළු සේවකයන් පත්වීම් ලබා ඇති තනතුරේම සේවයේ යෙදවිය යුතු වුවත් කම්කරු තනතුරු සඳහා බඳවා ගත් 09 දෙනෙකු වෙනත් කාර්යයන්හි සේවයෙහි යොදවා තිබුණි. |

2. මූල්‍ය සමාලෝචන

--------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 2,174,378 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.3,608,013 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,433,635 ක පහත වැටීමක් දක්නට ලැබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,433,635 ක පහත වැටීමට ආදායම් විෂයයන් 03 ක අඩුවීම හා වියදම් විෂයයන් 03 ක වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

-----------------------

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

---------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කල ආදායම , තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | | | | 2016.12.31 දිනට හිඟය | | |
|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | 2016.01.01 දිනට හිඟය | 2016.12.31 දිනට හිඟයෙන් අයකිරීම | 2016 වර්ෂයේ බිල් කිරීම් | වර්ෂයේ බිල්කිරීම් වලින් අයවීම | 2016.01.01 දිනට පැවති හිඟයෙන් හිග | වර්ෂයේ බිල් කිරීම් වලින් හිඟය | මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i ) වරිපනම් හා බදු | 2,535 | 1,730 | 5,599 | 4,248 | 805 | 1,351 | 2,156 |
| (ii ) බදුකුලී | 142 | 81 | 4,434 | 4,417 | 61 | 17 | 78 |
| (iii) බලපත්‍ර ගාස්තු | 86 | 2 | 661 | 661 | 84 | - | 84 |
| (iv) වෙනත් ආදායම් | 47,655 | 15,865 | 62,648 | 20,306 | 31,790 | 42,342 | 74,132 |
| එකතුව | 50,418 | 17,678 | 73,342 | 29,632 | 32,740 | 43,710 | 76,450 |

2.3.2 බලපත්‍ර ගාස්තු

----------------

වර්ෂයේ මාර්තු 31 දිනට පෙර ව්‍යාපාර බදු ලබා ගතයුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපාර 41 කට අදාලව 2016 ජුනි සිට ඔක්තෝබර් අතර කාලයේදී බදු ගෙවා තිබීමෙන් බලපත්‍ර රහිතව ව්‍යාපාර පවත්වාගෙන ගොස් ඇති බව නිරීක්ෂණය විය.

2.3.3 වෙනත් ආදායම්

-----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ජලගාස්තු

----------

2016 දෙසැම්බර් 31 දිනට ජල සැපයුම් ස්ථාන වලින් රු.364,424 ක හිඟ ජලගාස්තු අයකර ගැනිමට සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) පොදු වැසිකිලි බදු

---------------------

පොදු වැසිකිලි මුදල් නියමිත පරිදි අයකර ගැනීමට කටයුතු නොකිරීමෙන් 2013 හා 2015 වර්ෂවලට අදාලව අය නොවූ එකතුව රු. 4,198 ක හිගයක් පැවතුණි.

(ඇ) ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු

--------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2013 දෙසැම්බර් 20 දිනැති ගැසට් පත්‍රයේ 10 (ආ) කොටස යටතේ 2014 වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි දැන්වීම් පුවරු ගාස්තු සංශෝධනය කර තිබුණු අතර වර්ග අඩියක් සඳහා එක් මසකට හෝ ඉන් කොටසකට රු. 50 බැගින් අයකරන බව දක්වා තිබුණද ඒ අනුව කාලය නොසලකා ගාස්තු අයකිරීමෙන් වර්ෂය හෝ ඊට වැඩි කාලයක් පවතින ස්ථිර දැන්වීම් පුවරු සඳහා ලැබිය යුතු ආදායම් අහිමිව තිබුණි.

(ii) දුරකථන සමාගමකින් ලබාගෙන තිබුණු රු.23,000 ක දැන්වීම් පුවරු ගාස්තුවක් ලේඛනයේ සටහන් කර නොතිබුණි.

(iii) තාවකාලික දැන්වීම් පුවරු ගාස්තු ලෙස ලැබී තිබුණු රු.8,920 ට අදාල පුවරු ප්‍රමාණය , වර්ග අඩි ප්‍රමාණය, සවිකළ ස්ථානය ,ප්‍රදර්ශනය කරන දින වකවානු, ප්‍රචාරක සමාගම ආදී විස්තර ලේඛනයේ සටහන් කර නොතිබුණි.

(iv) 2016 වර්ෂයේදී පවත්වා තිබුණු අනවසර දැන්වීම් පිළිබඳ සමීක්ෂණයට අනුව අයවිය යුතු දැන්වීම් පුවරු ගාස්තු ප්‍රමාණය රු.192,713 ක් විය.

(ඇ) පරිසර ආරක්ෂණ බලපත්‍ර

------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) නියදි පරික්ෂාවේදී අනාවරණය වූ පරිදි පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගතයුතු ආයතන 15 ක් ව්‍යාපාර බලපත්‍ර ලබා නොගැනීම නිසා රු. 15,000 ක් සභාවට අහිමිවී තිබුණි.

(ii) 2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත් මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ ප්‍රකාශිත 1533/16 හා 2008 ජනවාරි 25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත 01 ක් බලපත්‍ර ලබා නොගැනීම නිසා රු.4,000 ක අලාභයක් සභාවට සිදුව තිබුණි.

2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ මුදල් රු.4,667,212 ක් ලබා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂය වෙනුවෙන් මුද්දර ගාස්තු උපලේඛන ලැබී නොතිබුණු අතර අයවැයගත අගය වූ රු.3,500,000 ක් ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. 2014 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදයට අදාලව අයවිය යුතු හිගය රු. 6,422,606 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යසාධනය

------------------

බස් නැවතුම්පල ආශ්‍රිතව වෙළඳ පල කඩ කාමර 51 ක් ඉදිකිරීමට 2015 වර්ෂයේදී සැළසුම් කර එයින් කඩකාමර 29 ක් සඳහා එක්වන් මුදල් ( key money) රු. 24,299,000 ක් අයකරගෙන තිබුණද 2017 මැයි 20 දින වනවිටත් කඩ කාමර ඉදිකිරීම සිදු කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

සභාවේ භාවිතා කරනු ලබන පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය මඟින් ලබාදී තිබුණු වාහන 03 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ජලයෝජනාක්‍රම දෙකෙන් කහබටේ ජලයෝජනාක්‍රමය සඳහා ක්ලෝරීන් යොදා ජලය පිරිසිදු කිරීම කලත් කිසිදු අයුරකින් පිරිසිදු කිරීම් නොකරන ලිහිනියාගල ජලයෝජනාක්‍රමයේ ජලය සමඟ මිශ්‍රකර බෙදාහැරීම නිසා ජල පාරිභෝගිකයන්ට පිරිසිදු පානීය ජලය සැපයීමට සභාව අසමත්වී තිබුණි. එකී ජලයෝජනාක්‍රම වලින් සපයන ජලයේ අහිතකර බැක්ටීරියා අඩංගු බවට දැරණියගල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිගේ පරීක්ෂණ වාර්තා මඟින් තහවුරුවී තිබුණි.

(ආ) 2012 සැප්තැම්බර් 19 දින සිට 2016 නොවැම්බර් 23 දින දක්වා ලැබී තිබුණු ගොඩනැගිලි අයදුම්පත් 21 ක් සඳහා පරීක්ෂණ ගාස්තු ගෙවා තිබුණද ඒවායේ පවතින අඩුපාඩු සම්පූර්ණ කර ගෙන අනුමත කර දීමට සභාව කටයුතු කර නොතිබුණි.

3.4 මතබේදයට තුඩුදුන් ගනුදෙනු

-----------------------------------

මධ්‍යම රජය හා පළාත් සභා කර්මාන්ත සඳහා ප්‍රදාන ආයතන විසින් මුදල් ලබා දීමට පෙර සභා අරමුදලින් ගෙවීම් කිරීම නිසා කර්මාන්ත 03 ක් වෙනුවෙන් ගෙවූ රු.1,533,527 ක් අයකර ගැනීම සඳහා මාස 02 සිට අවුරුදු 04 දක්වා ප්‍රමාදයක් සිදුවී තිබුණු අතර 2014 ජනවාරි 24 දින නක්කාවිට ප්‍රජාශාලාව හා වැසිකිලිය ඉදිකිරීමේ කර්මාන්තය සඳහා එසේ ගෙවා තිබුණු අත්තිකාරම් රු.54,187 ක් 2016 දෙසැම්බර් 31 දින වනවිටත් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

3.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

සභාවට අනුයුක්ත රියදුරන් ප්‍රමාණවත් නොවීම හා වාහන නිසි පරිදි අළුත්වැඩියා නොකිරීම නිසා සභාව සතු වාහන 4 ක් නිසි පරිදි භාවිතයට ගෙන නොතිබුණි.

3.6 හඳුනාගත් අලාභ

-------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු වාහන 02 අනතුරුවලට ලක්වීම නිසා සිදුවූ ඇස්තමේන්තුගත අලාභ හා රක්ෂණ සමාගම ගෙවීමට එකඟ වූ මුදල් අතර වෙනස රු.76,762 ක් අලාභ ලෙස දැරීමට සභාවට සිදුවී තිබුණි.

(ආ) 2016 සැප්තැම්බර් 07 දින අනතුරකට පත්වී තිබුණ සභාවට අයත් වාහනයකට රක්ෂණ සමාගම විසින් වන්දි ගෙවීම ප්‍රතික්ෂේප කර තිබුණද අදාල අලාභ තක්සේරු කර වගකිවයුතු නිලධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මාසික කුලී නොගෙවීම මත සභාවට අයත් මාළු කඩයක 2016 මාර්තු 31 දින සිට මුද්‍රා තබා තිබුණද ඒ සඳහා නැවත ටෙන්ඩර් කිරීම හෝ ඊළඟ ලංසුකරුගෙන් විමසා බදු දීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් දල වශයෙන් සභාවට රු.71,662 ක අලාභයක් සිදුවී තිබුණි.

(ඈ) දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 07 ක් සඳහා රු.3,000 බැගින් අයවියයුතු වාර්ෂික ව්‍යාපාර බදු අය නොවීම හේතුවෙන් රු.21,000 ක ලැබිය යුතු ආදායම් අහිමිවී තිබුණි.

3.7 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) විවිධ ප්‍රතිපාදන යටතේ කර්මාන්ත 164 ක් සඳහා රු.42,944,113 ක් ඇස්තමේන්තුගත කර තිබුණු අතර ඉන් රු.40,727,061 ක වැඩ නිමකර තිබුණි. එකී නිම් වටිනාකමින් රු.5,668,972 ක් පමණක් වර්ෂය තුළ ගෙවා තිබුණු අතර රු.35,058,089 ක් එනම් සියයට 86 ක් ණයහිමි ශේෂ විය.

(ආ) ආයතන තුනකට අයත් රු.872,246 ක් වූ කර්මාන්ත 05 ක් ක්‍රියාත්මක නොකර අත්හැර තිබුණි.

(ඇ) 2016 වර්ෂයේදී රු.23,242 ක් ගෙවා තිබූ ඇස්තමේන්තු වටිනාකම රු.686,098 ක් වූ කර්මාන්ත 03 ක් අවලංගු කිරීම / ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ගෙවූ මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

(ඈ) දැරණියගල සමන්දේවාල භූමියේ වැසිකිලි පද්ධතිය ඉදිකිරීමේ දී වැඩ විෂයයන් 04 කට අදාලව රු.19,231 ක් වැඩ නිම කිරීමට ප්‍රථම ගෙවා තිබුණි.

3.8 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

සභා බල ප්‍රදේශයේ එක්රැස් කරනු ලබන කැළි කසල හා අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීම හෝ විධිමත් පරිදි බැහැර කිරීමේ ක්‍රමවේදයකින් තොරව, සීතාවක ගඟ ආසන්නයේ පිහිටි සොහොන් බිමෙහි විවෘත ස්ථානයකට බැහැර කර තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

4.1 අයවැය පාලනය.

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන වෙන්කර තිබුණු වැය විෂයන් 48 ක එකතුව රු. 3,722,750 ක ප්‍රතිපාදන සියයට 100ක්ද, වැය විෂයයන් 24 ක එකතුව රු.42,034,994 ක ප්‍රතිපාදන වලින් සියයට 60 ත් සියයට 99 ත් අතර පරාසයක් ද වශයෙන් එකතුව රු.45,757,744 ක් උපයෝජනය කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | පෙර වර්ෂයේ විගණනයෙන් පෙන්වා දුන් වැරදි නිවැරදි නොකිරීම |
| | | (ii) | ජර්නල් සටහන් සමඟ ඉදිරිපත් කරන සන්ලක්ෂ පැහැදිලිනොවීම |
| | | (iii) | උප ලේඛන ගිණුම් සමඟ නොසැසඳීම |
| (ආ) | ආදායම් පරිපාලනය | (i) | වරිපනම් සඳහා දේපල තක්සේරුව නියමිත පරිදි නොකිරීම |

| | | |
|---|---|---|
| | | (ii) හිඟ ආදායම් අයකර ගැනීමට නීතිමය කටයුතු නොකිරීම |
| | | (iii) ව්‍යාපාර හා කර්මාන්ත සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් නොපැවැත්වීම |
| (ඇ) | අයවැය පාලනය | (i) ඇස්තමේන්තු ප්‍රතිපාදන වල සැලකිය යුතු ඉතිරිවීම් තිබීම |
| | | (ii) ඇස්තමේන්තුගත ආදායම් අයකර නොගැනීම |
| (ඇ) | වාහන පාලනය | (i) දෛනික ධාවන සටහන් ඉදිරිපත් නොකිරීම |
| | | (ii) වාහන වල ඉන්ධන පරික්ෂාව සිදු නොකිරීම |